(ලැයැදිලි කිරීමක් ‘ජීයා ආවාදැ’ උඹලා නැවාදැ? අදවැයිය දදාවන බසස්ලි දිරැක ස්වරය ශ්‍රුස්ස ඒ කියනවන බව ඔබ දනිති. අපේ භාෂා රීතිය අනුව දදකක අපා ඇති ‘අං’ යන්න ඒවනතම ගැස්ස ගොනසකා. මේ ගැටළුවට පිළියමක් වශයෙන් ශ්‍රුස්ස කකාර ගැස්ස ශ්‍රුතු ඒවනා ආ යන්න දිරැකයි සැදුවා අපදිල්ලෙට ගල් ගලුන්ක් යනදා ‘ං’ ලියමි. ඒ අනුව ‘ජීයක් ආවාදැ’ උඹලා නැවා දැ? කියලිය ශ්‍රුස්ස ‘අං’ ස්වරය ඒවනා ‘අං’ හා ඇතිවිය. එහමි (ඒසරගය) යනදා ඇති ගැටියයයි. මෙය අත්සදා ඉල්ලිමකි)

ඉස්සරහ ගෙදර චන්දරේගෙ ලෝකු කොල්ලා උදේ ආප්ප කඩේට ගිහිං එන ගමං අපේ ගේට්ටුව ගාව නැවතිලා කිවා මට වැඩක් නැත්නං පොඩි ගමනකුත් යන්න බලාගෙන එහේ එන්නෙය් කියලා ගුරුැන්නාන්සෙ මහත්තයෝ කීවා ය කියලෝ.

"ඔය ළමයා පාන්දරම ආප්ප කඩේ ගිහින් වගේ "
"ඔව් අප්පුහාමි, අපි අද ආත්තම්මලැ දිහා යනවෝ."
"එහෙනං ඔය ලමයේ පරෙස්සමෙං එහේ යන්න.. මං ගුරු ගෙදර පැත්තෙ යන්නං කො.."

හකුරු කෑල්ල හප හප සිරියාවතී හාමිනේගෙ ගොටු කොල කෑඳ ජෝගුව බීවා ම කියලෝ වැඩක් නෑ.. දවල් එක දෙක වෙනකං උනත් ඇද ගෙන යන්න පුලුහං. ගමනකුත් යන්න බලං එන්න කියපු හන්දා මං ඉතිං පිටත් වෙලා මගේ බස්තම බැලුවා. කෝ .. ඒක නෑ නොවැ.

"කෝ මගේ බස්තම..?"
"ආ.. ආ.. මං ඒක ටිකකට ගත්තේ කඩු හරඹ පුරැදු වෙන්න.."
"අර රෑ ඇහුනෙ ඒ සද්දෙ වෙන්නැ.. මං හිතුවා අර ඇමි ඒ රාමවන්දේර් ආය් ඇවිත් කියලා.."

මගේ සිහියේ හැටි සිරියාවතී හාමිනේ දන්නවා. කොහේ හරි බස්තම දාලා ආවාම ඒක ගෙයේ ගෙනත් තියන්නෙ උන්දෑ.

"ඔහේගෙ බස්තම ඊයෙ හැන්දෑවෙ හිටියෙ ගේට්ටුවට හේත්තු වෙලා.. මං ඒ පාර ගෙදර එක්කනවෝ.."

ඕකනේ කියන්නෙ බාරියාව හරියට ගෙදරට සිරි තාන්තාව වගේය කියලෝ.. නේද හාමිනේ.. මං ගුරු ගෙදෙට්ට යනවෝ.. ටිකක් පරක්කු වෙන්නත් පුලුවං.. හුගක් පරක්කු උනොත් එන්දරේගෙ දරුවෙකුට කතා කරගන්න..
මං ගුරු ගෙදර ගේට්ටුව ලඟට යන කොට ගුරුැන්නාන්සෙ මහත්තයෝ හිටියෙ මිදුලෙ හක්මං කර කර.

"ආය්බොවං අප්පුහාමි.. මං මේ මඟ බල බල හිටියෙ අප්පුහාමි එනකං... ඉති අද කාට යහපතක් කරන්නද කල්පනාව..?"
"මං ඊයෙට හීනෙං දැක්කෝ ගුරුැන්නාන්සෙ මහත්තයෝ. .. ඉතිං මට හිතුන් අද පාන්දරම ඔබ තුමා බැහැ දකින්න එන්න.."

ගුරුැන්නාන්සෙ මහත්තයා මගේ කරට අතක් දමාගෙනම ගේ ඇතුලට ගියා.

"අප්පුහාමිට පුලුවන් ද අද මට පොඩි සපෝර්ට් එකක් කරන්න.. කන්දෙ පන්සලේ සිල් ඇත්තො වුනාට අපේ ඉස්කෝලෙ හාමිනේ පොලොස් ඇඟුලක් බාර අරං.. හාමුදුරුවොත් අපේ ඉස්කෝලෙ හාමිනේගෙ පොලොස් ඇඟුලට හරි මනාපයි.. සිල් ඇත්තොත් තිස් පස් දෙනෙක් ඉන්නවාලු. අපි තුන් දෙනාම යමුද අද දානෙත් අරං පන්සල පවැත්තෙ..?" එයට මගේ උත්තර උවමනා නැත. එය ඒ හැටියටම ඉස්ට වන බව එතුමා දනී.

අපි පන්සලට යන විට දහයාමාරට විතර ඇති. බතුස් වට්ටක්කා යාලුවය් කරවල හොද්දයි මුගුනුවැත්ත මැල්ලුමයි සූදානං කරලා තිබුනා. අඩු වෙලා තිබුනෙ පොලොස් ඇඟුල විතරයි.

සිල් ඇත්තො ද්‍රම්මසාලාවෙ පැදුරු එලාන වාඩි වෙලා උන්නෝ. අපි තුන් දෙනයි තව දෙන්නේකුයි දනෙ පිලිගැන්නුවෝ. මං සිල් ඇත්තො තුන් දෙනෙකුට දානෙ පිලිගන්නලා හතර වෙනියෝ ලඟට ගියා. මෙන්න බොලේ පන්නල කංකානං හාමිනේ සිල් සමාදං වෙලෝ. මට නිකම්ම කියදානා.

"කංකානං හාමිනේ .." කියලා මං තව එක දානෙ පිගානක් පිලිගැන්නුවා තව උපාසකම්මා කෙනෙකුට. සිල් ඇත්තො දානෙ වලඳන්න පටං ගත්තා. අපි ඉතිං එලියට බැස්සෝ. උපාසකම්මලා තිස් එක් දෙනාට උපාසක තාත්තලා හිටියෙ හතර දෙනයි. ඒත් හැරමිටියෙ යන වයසෙ ඇත්තො. කංකානං හාමිනේට නං අවිරුදු හැට දෙකකට වැඩිය නෑ. මං හිතන්නෙ. එයා පැන්සං ගත්තෙ ගිය අවිරුද්දට උඩිං අවිරුද්දෙ. එක දිගටම වැඩ කලේ ..... ඉඳිපිරිතාලෙ. ඉස්කෝලෙ හාමිනේ සිල් ඇත්තො දානෙ වලඳන හරියෙ නැවතුනා. අපි දෙන්නා පන්සල් වත්තෙ නා ගහ යට ඇන කියාන හිටියෝ.

"ගුරුැන්නාන්සෙ මහත්තයාට මතකද.. අර කංකානං හාමිනේට ඉස්පිරිතාලෙදි නං කිව්වෙ පන්නල හාමිනේ කියලෝ.."

"මොකෝ මට මතක නැත්තෙ.. අර ඉස්පිරිතාලෙ ලෙඩ්ඩුංගෙ කෑම හොරකං කරගෙන යන කොට මොටෝ සයිකලේක හැපිලා සුමානයක් විතර ඉස්පිරිතාලෙ හිටියෙ ඔය ගැනි නෙස්.."
"අන්න හරි.. මිනිහා කසිප්පු බීලා කානු වල පෙරලිලා ඉන්නකොට කොල්ලො දෙන්නා ඇවිත් උස්සගෙන යන්නෙ.."

එදා ඉස්පිරිතාලයක් නෑ.. හැම තැනම කසු කුසු.. කිරි බෝතල දෙකම කුඩු වෙලා.. තම්බපු බිත්තර පහයි, පාං ගෙඩි දෙකයි.. උයපු මස් බාන්නයයි සේරම පාරෙ විසිරිලා. රෙදිත් ඇඳං ආය් පාරෙ යනව නෙස්. සිල් අරගෙන කරපු පව් සමා කරනවා ඇති...

අනිත් අයගෙ රෑ මුරෙත් අරගෙන රෑ වැඩ මය් ඔය ගැනි කලේ... රෑ වැඩ කියන්නෙ අය්නක් අල්ලං නිදා ගන්න එක නෙස්. තව තව වැඩත් කලාලු.. ඒ ගැන හරියට කියන්න අපි දන්නෑ... මොකෝ අපි රෑට ඉස්පිරිතාල මුර කරන්න යනවය්.. ඉසිපිරිතාගෙ රෙදි ගෙදර පොට්ටනි ගහං.. කෝප්ප, ජෝගු, බේසං, පනිටිවු දුසිං ගනං.. ඉස්පිරිතාලෙ බෙත් පරන වෙලා කුනු වලට දානවෝ...

උදේට පුංචි ඇය මග බලං ඉන්නවෝ.. අම්මෝ එනකං.. උන් දන්නවෝ අම්මා එනකොට පාං, කිරි, ඔස්, මාලු, බිත්තර පොදි බැඳගෙන එන බව. ලෙඩ්ඩුන්ට බෙදල ඉතුරු පහද වෙන දෙයක් ගෙනිහිං දරුවන්ට කවන එක වෙනම එකක්. මේක ලෙඩ්ඩුන්ට අයිති කෑම බීම හොරකං කර ගෙන යෑමක්.. හුගක් දවස් වල මේ ගැනි දවල්ටත් ඉස්පිරිතාලෙ කරක්ගහනවෝ.. තැරැුවකාරියො ලෙඩ්ඩුංගෙ නැයො ආපුහාම කියනවෝ .. අර පන්නල හාමිනේ තමය් රෑට ලෙඩ්ඩු බලා ගන්නෙ.. එයාට සුලු සංගරහයක් කරාම ලෙඩා හොඳට බලා ගන්නවා ය කියලෝ. අනේ ඉතිං ඒ මිනිස්සුත් මේ ගැනිට පුප වට්ටියක් පිලිගන්නලා යනවෝ.. ගැනි ඉතිං පැදුරෙ ඉඳං ලෙඩ්ඩු (දිහා) බලා ගන්නවා.

හැබැය් ඉතිං ඒව යා දුන්නෙ නෑ.. මිනිහෝ අන්සබාගෙ හැදිලා එක තැන.. දුව මිනිහෝ දාලා ගිහිං කොහේද නැවතිලා ලේසි රස්සාව කරනවෝ ලු. පුතාට ඔල්මාදෙ මී මැස්මුර දෙකම..
"ඕක තමය් කියන්නෙ පවට පින් දෙන්න බෑ කියලා... කරන කලට පව් මිහිරිය මී සේ.. විඳින කලට දුක් දැඩි වෙය් ගිනිසේ... නේද අප්පුහාමි..."
"අම්මපා ඇත්ත ගුරුැන්නාන්සෙ මහත්තයා.. බුදු බන බොරු කරන්න බෑනේ.."

ඔබ මා හමුවන මේ ඉර හඳ යට
කොතැනක සිටියත් මා ළඟ දවසට
මගෙ ළඟ තනියට ඉනු මැනවී

ඔබ සිත මා සිත තනි වූ දා සිට
මා ළය පීදී පරවුණ පෙම් මල
සිතින් තුරැලූ කර මා මළ දවසට
මගෙ ළඟ තනියට ඉනු මැනවී

කඳුල සුසුම් නොහෙළා නොදොඩා අපි
මිරිඟු සයුර වෙත පියමං කළ හැටි
සිතින් දරාගෙන මා මළ දවසට
මගේ ළඟ තනියට ඉනු මැන වී

පද රචනය සුනිල් ආර් ගමගේ
තනුව සංගීතය ගුණදාස කපුගේ

ගීයක පිටුපස සැඟවුණ කතාව

අපේ කථිරිය එකතු වෙලා උන්නා මේ පිටගත කිරීමේ වැඩේ ට.

"මතකද ඒ කථිරිය..?"

"මගේ මතකයට මේ වෙලාවේ එනවා ස්වර්ණ ශ්‍රී බණ්ඩාර, සිරිල් රාජපක්ෂ, කුලසේන ගොන්සෙ-්කා, ජී ඊ වික්‍රමසිංහ, ප්‍රේමකීර්ති ද අල්විස්. සේන ගුණසේකර,ථ විජයානන්ද අයවීර, බුඩිමන් ජයවීර, ශ්‍රීයාණි සමරනායක, ජෝතිපාල තෙබුවන, රංජිත් රූපසිංහ වගේ අයව."

"මදැයි.. ගීත රචනයෝම කි දෙනෙක්ද? හරියට කලවළි මංගලයක් වගේ තියෙන්න ඇති"

"ඇයි ඔය විතරක්ද.. අපේ වාදක මණ්ඩලය? සිරිල් පෙරේරා, සේන දළුවත්ත, කුමාර එප්පාවල, ජේ ඒ ගුණවර්ධන, ලෝඩ්දාස සූරියආරච්චි, ජයතිලක බණ්ඩාර, ගාමිණි ගුණසේකර, ලයනල් ධර්මදාස, හෙට්ටිආරච්චි.."

"මේ අය පාලනය කරන්න වෙනම කෙනෙක් තියන්න වෙන්න ඇතිනේ."

"ඔය හැම දෙනාම පාලනය කලේ ශබ්ද පරිපාලනය කරපු ගුණදාස කපුගේ මහත්මයා ම තමයි.." දිවුල්ගනේ කිව්වේ හිනා වෙමින්.

අමුතු කතාවක්නෙ මේ කියන්නෙ.. විශාරද ගුණදාස කපුගේ සංගීතඥයා අප හඳුනාගෙන හිටියේ අතරිත කලාකරුවෙක් හිටියට විතරයි. ඇත්ත වශයෙන් ම එතුමාගේ ගුවන් විදුලි ආගමනය ශබ්ද පරිපාලකවරයකු වශයෙන්.

ඔබ මා හමුවන මේ ඉර හඳ යට

පසුගිය දා මෙල්බර්න් නුවර පැවැත්වුණ සංහිඳ පාමුල ගී සරණිය රසිකයන් ඇඳ බැඳ දැහැන් ගැන්වූයේ කලුබලකාරී වූත් ඝෝෂාකාරී වූත් රස උද්දීපනයෙන් හෝ විච්චූර්ණ ඇස් බැන්දුම් වලින් හෝ නොවේ. නිසැංසලේ ලගාන්විතව ගලා බසිනා හරයෙන් පරිණත වූ ගී නදී දිය දෝරසිනි. ඊට සිය ඕජරය හඬ මුහු කළ ළබරඳි ගායන ශිල්පියායි කරුණාරත්න දිවුල්ගනේ. ඔහුගේ හඬ මෙන්ම තෝරා ගන්නා ලද පද රචනාත් ඊටම ගැලපී ගිය තනු හා සංගීත රටාත් අර්ථ පූර්ණ සහ භාව පූර්ණ ඒවා ම වමයි විශේෂත්වය. අනේක වූ හැලු හැස්පීම් මධ්‍යයේ බමන මිහි තලයේ නොසැලී සිය ස්ථාවරත්වය පවත්වාගෙන යාමට අඩිතාලම දැඟිණ සුගයක කළ ගායනාවක මතකය අවුලවාලන්නට ගීසඳළුවව සමඟ එක්වීය හේ.

මම එතකොට රජරට සේවයේ ආදුනික ශිල්පියෙක්. දිවුල් කාතාවට මුල පිරුවා. ඒ කියන්නේ අසූ හතරෙ විතර.. මගෙ මතකයේ හැටියට... ඒ දවස්වල රජරට සේවයට පටිගත කිරීම් වලට අඩු වැඩිය හරියට තිබුණෙ නැහැ.. කොහොඹ ගහක් යට තමයි අපි මේ කියන සින්දුව පටිගත කළේත..

සිසිල් කොහොඹ තුරු සෙවනක පටිගත කෙරුණ ගීයක්. කොතරම් අපූරුද? කොහොඹ සෙවනේ සිහිල ගීයටත් අනිවාර්යයෙන්ම මුහු වන්නට ඇති. කුමක්ද ඉතින් මේ ගීය..? ඔබ මා හමුවන මේ ඉර හඳ යට..

"ඇත්තෙන්ම ඔව්.. කොහොඹ ගහේ සිහිල විතරක් නෙවෙයි ඒ ගහේ වතලා උන්නු කුරුල්ලන්ගේ හඬ පවා මුල් පටිගත කිරීමට ඇතුල් වුණා. ඒවා මඟහැරලා මේ පටිගත කිරීම කරන්න හරිම අමාරු වුණා."

ඔබ මා හමුවන මේ ඉර හඳ යට.. ඉර හඳ හමුවන ආකාසේ යට.. ඒ යට හමුවන කොහොඹ සෙවන යට.. ඒ යට හමුවන කුරුවි ගීතයට... ගීතය පිළිබඳව තවත් ගීයක් පබඳින්නට තරම් සුන්දර අත්දැකීමකි මේ.

"මේ ගීතය මට ලැබුණ ගීතයක් නොවෙයි.. සුනිල් ආර් ගමගේ මහත්මයා කපුගේ මහත්මයාට එවපු පද රචනයක්.. කපුගේ මහත්මයාගෙයි තනුවත් සංගීතයත්.." දිවුල්ගනේ ශිල්පියා නැවතත් කතාවට එළඹුණා.
අනුරාධපුරයේ කඩ පනහ ප්‍රදේශයේ තිබුණු රජරට ගුවන් විදුලියේ භූමි භාගයට එදා මේ ගීතය ඒ දවස් වල රජ රට ගුවන් විදුලි කලාපයේ ජනප්‍රීය ගීයක් වුණ නිසා මගේ ඇසට අසුවන මායිමේ කැසව් එකට එකතු කළා. දිවුල්ගනේ ශිල්පියා සිය අතිතාවර්ජනය හිමා කරමින් කියා සිටියා. සන්නස පාඨකයන් වෙනුවෙන් සිය මතකය අවුලවා ලූ කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාණන්ට ගී සඳළුවව වෙතින් ස්තූතිය පිරිනමමින් තව තවත් රස ගී නවවින්නට හැකි වේවා යි සුබ පැතුවා.

ඔබත් මාත් හමුවන මේ ඉර හඳයට කොතැනක

සිටියත් මා මළ දිනයක මා ළඟ තනියට හිඳින්නැයි මේ ගී පද වැසෙන් ගියේද ප්‍රේමවන්තයා අපේ පුවීණ ගේය පද රචක සුනිල් ආර් ගමගේ ළබැඳිකාරී. අප කෙතරම් දුරක වෙන්ව ගියද මගේ හඳ ගැබසෙන අහස් කුසය යටම රැඳිය යුතුම නොවේ ද? මා මීය ගිය දිනෙකදී හෝ ඔබට මා හමුවීමට අප අතර ඇති දුර බාධාවක් නොවන්නටයි මේ පතුම්.

අප දෙදෙනාගේ සිත් තනි වූ දින සිට මගේ සිතේ හටගත් ආදරය වියැකී ගියේ පරමුණ මලක් ලෙසිනි. පරවුව ද එය මලකි. ඒ පර මල සිතට ලංකරගෙනම මා මීය ගිය දිනෙක මා ළඟ තනියට හිඳින්නටයි අයැදුම්. දුක හඳුනා නොගත් සතුටින් සපිරි ලෝකයකට අප දිනෙන් දින ගමන් කළේ මිරිඟු දියෙන් සැදි සයුරක් වෙත යන්නන් ලෙසිනි. මිරිඟුව යන්න මුලාවකි. කළුපක්, සුසුම්ක් නොහෙළන සතුටින්ම සපිරි ලොවක් ගැන සිතීම පවා මුලාවකි. මේ හැම දෙයක් ම

22 පිටුව